**තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වත්කම්, බැරකම් සහ ස්කන්ධය/ශුද්ධ වත්කම් නිවැරදි පිළිවෙලට ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වත්කම්, බැරකම් සහ ස්කන්ධය/ශුද්ධ වත්කම් නිවැරදි පිළිවෙලට ඇතුළත් කළ යුතු වේ. |
| (ආ) කොමිෂන් සභාව විසින් හීනවන ශේෂ ක්‍රමයට වත්කම් ක්ෂය කර තිබුණු නමුත් එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 86 (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 86(ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂවල ලැබී තිබූ එකතුව රු.10,362,333 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 (සංශෝධනය) ප්‍රකාරව ආදායමට නොගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ලෙස දක්වා තිබීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන රඳවාගැනීමේ ඉපයීම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද ප්‍රකාශිත ප්‍රාග්ධන ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද දැක්වුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වත්කම් බැරකම් සහ හිමිකම් ඉදිරි වර්ෂයේ සිට ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදිරි වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.82,996 ක්වූ පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සේවා ගාස්තු වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම වටිනාකමින් වැඩියෙන්ද ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන්ද දැක්වුණි. | ඉදිරි වර්ෂ සඳහා කළ වියදම් ප්‍රවර්ථන වර්ෂයේ වියදම් ලෙස වාර්තා වී තිබීම ඉදිරියේදී සිදු නොවීමට වග බලා ගන්නා බව දන්වා ඇත. | ඉදිරි වර්ෂය වෙනුවෙන් කළ ගෙවීම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | දැනට භාවිත යන්ත්‍රය වෙනුවට නව යන්ත්‍රයක් අදාළ ආයතනයෙන්ම ලබා ගැනීමට ලිපියක් යොමු කර ඇති බවත් ඉදිරි වර්ෂ සඳහා සේවා ගිවිසුමකට ද එළඹීමට ද කටයුතු කර ඇති බවත් දන්වා ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිවාඩු දිනවල සේවය කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය මත හා ලිත් මසකට දින දෙකකට වැඩි දින ගණනක් සේවයේ යෙදවීමට අවශ්‍ය වන්නේ නම් අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව එකතුව රු.39,879 ක නිවාඩු දින දීමනා ගෙවා තිබුණි. | ඉදිරියේදී මෙම කරුණු නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. නිලධාරීන්ගේ දැඩි හිඟය හේතුවෙන් දැනට කාර්යාල මණ්ඩලයේ සේවය කරනු ලබන නිලධාරීන් තම අතිරේක රාජකාරී සඳහා ද යොමු වීමට සිදු වී ඇති බව දන්වා ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 0120/20 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කොමිෂන් සභාව විසින් 2023 දෙසැම්බර් 31දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2023 වර්ෂයට අදාළ විගණනයෙන් පසුව අප විසින් 2023 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඇති බවත් මේ වන විට එහි ලේඛන සකස් කරමින් පවතින බවත් දක්වා ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසායන් සඳහාවූ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ - 4.4 වගන්තිය | 2018 වර්ෂයේදී කොමිෂන් සභාව ආරම්භ කර තිබුණු අතර අදාල විධිවිධාන ප්‍රකාරව මේ දක්වා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | සමස්ත කාර්යය මණ්ඩල සංශෝධනයක් සිදු කිරීම සඳහා දෙන ලෙසට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලුම් කර තිබෙන බවත් එම යෝජනාව ස්ථිර වූ පසු හා අභ්‍යන්තර විගණක තනතුරක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන බව දක්වා ඇත. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව සහ ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් (මාස 05) ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා විගණන වාර්තාව ඇතුලත්ව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව සඳහන් වුවත් මෙම වාර්තාවේ දින වන විටත් කොමිෂන් සභාව | 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ දෙමළ භාෂා පරිවර්තනයේ ප්‍රමාදයන් හේතුවෙන් එය මෙතෙක් මුද්‍රණය කර නොමැති අතර 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත යවා ඇත. එමෙන්ම 2023 වර්ෂයට අදාළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව සකස් කරමින් පවතින බව දැනුම් දෙමි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අදාළ ආකෘතිය අනුව සකස් කර අනුමැතිය ලබාගෙන ගත යුතු වේ. |

විසින් 2023 වර්ෂයට අදාල කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර කොමිෂන් සභාව විසින් 2021 සහ 2022 වර්ෂයන්වලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරද නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,815,984 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,912,855 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.96,871 ක ඌණතාවයෙහි අඩුවීමක් නිරීක්ෂණය විය. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන ලැබීම් සියයට 23 කින් වැඩිවී තිබීමත් වියදම් කපා හැරීමත් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ රු.51,500 කට මිලදීගෙන තිබුණු ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍රයේ වාර්ෂික සේවා කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව හා අදාල සමාගම අතර ගිවිසුමකට එළඹ නොතිබුණි. එසේම යන්ත්‍රයෙන් පැමිණීමේ හා පිටවීමේ වේලා සටහන් වාර්තා ලබාගෙන නොතිබුණු අතර විගණිත දිනය වූ 2024 අප්‍රේල් 10 වන විට මෙම යන්ත්‍රය ක්‍රියා විරහිත වී තිබුණි. . | මේ වන විට අදාළ යන්ත්‍රයේ දෝශ නිවැරදි කර දෙන ලෙසට යන්ත්‍රය සැපයූ ආයතනයට ලිපියක් යොමු කර ඇති අතර ඉදිරි වර්ෂ සඳහා සේවා ගිවිසුමකට එළඹීමට ද එම ආයතනයෙන් විමසීමක් කරනු ලැබ ඇත. | අදාල සමාගම සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර යන්ත්‍රයෙන් පැමිණීම හා පිටවීම සටහන් කළ යුතු වේ. |
| (ආ) | කොමිෂන් සභාවේ කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා 2023 දෙසැම්බර් 11 දින ඉල්ලුම් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනට විභාග කිරීමට පවතින අභියාචනා සංඛ්‍යාව හා එහි කාල විශ්ලේෂණ තොරතුරු 2024 අප්‍රේල් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවීය. | 2023 වර්ෂයට අදාළ අභියාචනාවන්හි සංක්ෂිප්ත වාර්තාවක් අභියාචනා අංශය විසින් මේ වන විට සකස් කරමින් පවතී. | අභියාචනා සංඛ්‍යාව හා එහි කාල විශ්ලේෂණ තොරතුරු ඉදිරිපත් කල යුතු වේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් සභාපති ඇතුළු සාමාජිකයින් 5 ක් කොමිෂන් සභාවට පත් කරනු ලබයි. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂක ජනරාල්වරයා වන අතර කොමිෂන් සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන බවට තීරණය කරනු ලබන නිලධාරීන් සහ සේවා නියුක්තිකයන් සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු වේ . ඒ අනුව 2023 දෙසැම්බර් 31දින වන විට කොමිෂන් සභාවේ අනුමත මුළු සේවක සංඛ්‍යාව 26ක් වුවත් තත්‍ය සේවක සංඛ්‍යාව 10 ක් වූයෙන් පුරප්පාඩු 16 ක් පැවතුනි . | මෙම කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 26ක් වුවත් දැනට සේවයේ නිරත සේවක සංඛ්‍යාව 10 ක් වන අතර ඉදිරියේදී පුරප්පාඩු සපුරාලීම සඳහා බඳවා ගැනීම් සිදු කරනු ඇත. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ආරම්භයේ සිටම ස්ථිර නිලධාරියකු පත් කර නොතිබුණු අතර එම තනතුර කොන්ත්‍රාත් පදනම හා වැඩ බැලීමේ පදනම මත සම්පූර්ණ කර තිබුණි. තවද 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුර, නීති නිලධාරී තනතුර හා නීති සහකාර තනතුරු 04 පුරප්පාඩුව පැවතීම කොමිෂන් සභාවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී බැහැර කළ නොහැක. | කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ-ජනරාල් තනතුර සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට පැවරී ඇති බලතල අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කර ගැනීමට කොමිෂන් සභාවට හැකි අතර ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කර ඇත. පුරප්පාඩු පැවති පර්යේෂණ නිලධාරී හා නීති නිලධාරී තනතුර සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව නිලධාරීන් පත් කර ඇති අතර පුරප්පාඩු පවතින ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම් කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |